**සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සති පාසල**

**10 ශ්‍රේණිය   භූගෝල විද්‍යාව   ඔක්තෝම්බර් 4 සතිය**

**නිපුණතාව ඃ-** භෞතික හා මානුෂ ක්‍රියාවලින්ගේ අන්තර් ක්‍රියා භෞතික හා මානුෂ පරිසරය කෙරෙහි බලපාන ආකාරය පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි.

**නිපුණතා මට්ටම ඃ-** ලෝකයේ නිෂ්පාදන කර්මාන්තවල ව්‍යාප්තිය, ලක්ෂණ හා ගැටලු පැහැදිලි කරයි.

**මෙම පාඩම තුළින් ලබා ගත හැකි ඉගෙනුම් පල ඃ-**

* ශ්‍රී ලංකාවේ කර්මාන්ත ව්‍යාප්තියට බලපෑ සාධක ඉදිරිපත් කරයි.
* ව්‍යාප්තිය දැක්විය හැකි කර්මාන්ත ස්ථානගත වීම ශ්‍රී ලංකා ආකෘති සිතියමක ළකුණු කරයි.
* එක් එක් කර්මාන්ත පවත්වා ගෙන යාමේ දී ඇති වන ගැටළු අවම කර ගැනීමට යෝජනා ඉදිරිපත් කරයි.
* එක් එක් කර්මාන්ත ආශ්‍රිත නව ප්‍රවණතා පිළිබඳ අදහස් දක්වයි.
* තෝරාගත් කර්මාන්තවල වත්මන් තත්ත්වය පිළිබඳ පැහැදිලි කිරීමක් කරයි.
* ශ්‍රී ලංකා ආර්ථිකය තුළ කර්මාන්තවල වැදගත්කම පැහැදිලි කිරීමට කරුණු ඉදිරිපත් කරයි.

**පාඩම ඃ-** ශ්‍රී ලංකාවේ කර්මාන්ත කිහිපයක ව්‍යාප්තිය, ගැටලු හා ප්‍රවණතා - ආහාර හා පාන වර්ග නිෂ්පාදන කර්මාන්තය, ගෘහ කර්මාන්තය

**ශිෂ්‍යයා කළ යුතු කාර්යයන් ඃ-**

10 ශ්‍රේණිය භූගෝල විද්‍යාව පෙළ පොතෙහි පිටු අංක 129 සිට 132 තෙක් හොඳින් කියවන්න. පහත දක්වා ඇති සටහනද උපයෝගී කරගත හැකි පොත්පත් හා ඉගෙනුම් ආධාරකද පරිශීලනය කර වැඩිදුර අධ්‍යයනය කරන්න.

▪ ශ්‍රී ලංකාවේ සකස් කරන ලද ආහාර හා පාන වර්ග (ඇසුරුම් කළ ආහාර හා පාන වර්ග), ආහාර හා පාන වර්ග නිෂ්පාදන කර්මාන්තයට අයත් වේ.

▪ කුඩා, මධ්‍ය පරිමාණ හා ගෘහ කර්මාන්ත ලෙස විවිධ මට්ටමේ ආයෝජකයින් රැසක් මෙම කර්මාන්තයෙහි නිරතව සිටී.

▪ කාර්ය බහුල ජීවන රටාව තුළ සකස් කරන ලද ආහාර සඳහා ඉල්ලුම වැඩි වීමත්, ආහාර නිෂ්පාදන රැසක් අපනයනය සඳහා යොදා ගැනීමත්, ආකර්ෂණීය ප්‍රචාරණ ක්‍රම යොදා ගැනීමට යොමු වීමත් මෙම කර්මාන්තය තුළ වර්තමානයේ දක්නට ඇති ප්‍රවණතා වේ.

▪ ගෘහ කර්මාන්ත යනු සුළු ආයෝජනයක් සහිතව, බොහෝ විට පවුලේ ශ්‍රමය මත, ව්‍යවසායකයාගේ නිවස තුළ හෝ ආසන්නයෙන් පවත්වාගෙන යනු ලබන කර්මාන්ත වේ.

- ගෘහ කර්මාන්තයන්හි ඇති විශේෂත්වය වන්නේ බොහෝ විට දේශීය සාම්ප්‍රදායික ශිල්ප ක්‍රම යොදා ගැනීම නිසා දේශීය කලා සම්ප්‍රදායන් හා සංස්කෘතික උරුමයන් සුරැකීමයි.
- අත් යන්ත්‍ර රෙදි විවීම, බීරළු හා කැටයම් කැපීම, වේවැල් භාණ්ඩ නිෂ්පාදනය, මැටිභාණ්ඩ නිෂ්පාදනය, පිත්තල භාණ්ඩ නිෂ්පාදනය මෙරට ගෘහ කර්මාන්ත කිහිපයකට උදාහරණ වේ.

**ක්‍රියාකාරකම**

01. ආහාර හා පාන වර්ග නිෂ්පාදන කර්මාන්තය ඇසුරෙන් පහත වගුව සම්පූර්ණ කරන්න.

| ආහාර හා පාන වර්ග නිෂ්පාදන කර්මාන්තය | | | | |
|---|---|---|---|---|
| විවිධ මට්ටම් | නිෂ්පාදන භාණ්ඩ | ව්‍යාප්තිය | ගැටලු | ප්‍රවණතා |
| | | | | |

02. ගෘහ කර්මාන්තයක් යන්න හඳුන්වන්න.
03. මෙම කර්මාන්තයෙහි කැපී පෙනෙන ලක්ෂණයක් ලියන්න.
04. මෙරට දක්නට ඇති ගෘහ කර්මාන්ත පහක් ලියන්න.
05. ගෘහ කර්මාන්තයන්හි දක්නට ඇති ප්‍රවණතා හා ගැටලු තුන බැගින් සඳහන් කරන්න.
06. ගෘහ කර්මාන්ත සංවර්ධනය කිරීම සඳහා රජය ගෙන ඇති ක්‍රියාමාර්ග තුනක් සඳහන් කර ඉන් එකක් පැහැදිලි කරන්න.

**ඉහත ක්‍රියාකාරකම් සඳහා උපයෝගී කරගත හැකි පොත්පත් හා ඉගෙනුම් ආධාරක ඃ-**


- Geological Survey and Mines Bureau, Sri Lanka Minerals Year Book – (2012)
- The National Atlas of Sri Lanka (2007)
- කාර්ය සමාලෝචනය (2012), කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය.
- මානුෂ භූගෝල විද්‍යාව, දෙවන කොටස (2009), අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, කොළඹ.
- ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව (2012), ශ්‍රී ලංකා මහ බැංකුව.
- හේරත් ජේ. ඩබ්. (1979), ශ්‍රී ලංකාවේ ඛනිජ සම්පත්, භූ විද්‍යා සමීක්ෂණ දෙපාර්තමේන්තුව.
- e නැණ පියස - (enenapiyasa.lk)
- හොරණ කලාප අධ්‍යාපන කාර්යාලය - සවියෙන් පෙරට යූ ටියුබ් නාලිකාව https://www.saviyenperata.com/